# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1701/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 11/11/2024 පැය 1930

**මාධ්‍ය නිවේදනය**

**කොච්චිකඩේ පොලිස් ස්ථානාධිපතිවරයා අත්අඩංගුවට ගැනීම - කොළඹ උතුර අපරාධ කොට්ඨාසය.**

2024.11.03 වන දින කොච්චිකඩේ පොලිස් වසමේ මැතිවරණයට අදාල පෝස්ටර් ඉවත් කිරීමේ රාජකාරි යෙදී සිටි කොච්චිකඩේ පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂකවරයෙකු ඇතුළු නිලධාරීන් කණ්ඩායමකට, එක් අපේක්ෂකයෙකුට අදාලව පමණක් පෝස්ටර් හා බැනර් ඉවත් නොකරන ලෙසට බැන තර්ජනය කරමින් රාජකාරියට බාධා කර, අඩම්තේට්ටම් කිරීම, එමෙන්ම පොලිස් ආඥා පනතේ සඳහන් වැරදි සිදුකිරීම සහ මැතිවරණයට අදාලව පවතින නීති උල්ලංඝණය කිරීම හේතුවෙන් කොළඹ උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් 2024.11.11 වන අද දින කොච්චිකඩේ පොලිස් ස්ථානාධිපතිවරයා අත්අඩංගුවට ගන්නා ලදී.

මැතිවරණ කොමිසමෙන් ලද පැමිණිල්ලකට අනුව විමර්ශන කටයුතු සිදුකර කොළඹ උතුර අපරාධ කොට්ඨාසය මගින් මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත.

කොළඹ උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන කටයුතු සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**